# Linux (ලිනක්ස් උගනිමු - 01 කොටස)

## 01. Software

සම්පුර්ණයෙන්ම සිංහල හෝ ඉංග්‍රීසි භාෂාවෙන් සකස් නොකරන මෙම පාඩම සිංහල හා ඉංග්‍රිසි මිශ්‍ර ලෙස සකස් කර ඇත. ඊට හේතුව වන්නේ බොහෝ පරිගණක වචන වල සිංහල අදහස භාවිතය අපට හුරු පුරුදු නොවන නිසාය.

Software අපට මෙසේ කොටස් වලට බෙදිය හැක.



## Property software

මෙම වර්ගයේ මෘදුකාංග නැවත සකස් කිරීම වෙනස් කිරීම හෝ බෙදාහැරීම තහනම් වන අතර නිර්මාණකරුවාගේ නීතිරීති වලට අවනත වෙමින් පමණක් භාවිතා කළ හැක. පිටපත් කිරීමද කළ නොහැක. බොහෝ මෘදුකාංග එක් පරිගණකයකට පමණක් භාවිතා කල යුතුය.

Ex: M$ Windows

## Shareware software

මෙම වර්ගයේ මෘදුකාංග වෙනත් පරිගණකවලට පිටපත් කිරීමට අවසර ලබාදී ඇති අතර ඕනෑම භාවිත කරුවෙක් දිගුකලක් මෙම මෘදුකාංග භාවිත කිරීමට බලාපොරොත්තු වන්නේ නම් මුදල් ගෙවා එම මෘදුකාංගය ලියාපදිංචි කරගත යුතුය.

Source codes ලබානොදෙන අතර භාවිත කරුවන්ට මෘදුකාංගය නැවත සකස්කිරීම තහනම් වේ. බොහෝවිට මාස 1 ක් සතියක් හෝ නිස්චිත කාලයකට පමණක් නොමිලයේ භාවිත කල හැක.

Ex: WinZip, converters, screensaver builder

## Freeware software

මෙම වර්ගයේ මෘදුකාංග වෙනත් පරිගණකවලට පිටපත් කිරීමට භාවිතා කිරීමට බෙදාහැරීමට අවසර ලබා දී ඇත. මේවා අන්තර්ජාලය මගින් නොමිලයේ ලබාගත හැකි අතර අළුත් කිරීමක් හෝ භාවිත කිරීමට මුදල් ලබාදීමක් සිදුකල යුතු නොවේ. මෘදුකාංගය වෙනස් කිරීමක් සිදුකල නොහැකියි.

Ex: Adobe Reader, Players

## Free software

Free software වචනයේ අර්ථයෙන්ම නිදහස් වූ මෘදුකාංග වේ. මෙම වර්ගයේ මෘදුකාංග එහි පවතින සුළු නීති රීති කිහිපයකට යටත්ව අපට අවශ්‍ය ආකාරයට නැවත සකස් කල හැක. මෙහිදී Source codes ලබා දෙන අතර GNU licence වලට අදාලව එය වෙනස් කිරීමේ අවස්ථාවද ලබා දී ඇත. ලිනක්ස් මෙහෙයුම් පද්ධතියද මෙම වර්ගයට අයත් වේ. මෙම නිසා බොහෝ ලිනක්ස් සංස්කරණයන් නොමිලයේ හෝ ඉතාම අඩු මුදලකට ලබාගත හැක.

www.eduLanka.com
info@eduLanka.com